# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2323/24 - 2023 මාර්තු මස 16 වැනි බ්‍රහස්පතින්දා - 2023.03.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥාපනත (420 වන අධිකාරය)**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවෙහි (2) වන අනු ව්‍යවස්ථාව සමග කියවිය යුතු ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥාපනතෙහි (420 වැනි අධිකාරය) 54 වැනි වගන්තිය සමග කියවිය යුතු 55 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිවරයා විසින් සකස් කරන ලද නියෝග.

**රනිල් වික්‍රමසිංහ,**
ජනාධිපති සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ
ජාතික ප්‍රතිපත්ති විෂයභාර අමාත්‍යවරයා.

2023 මාර්තු මස 16 වැනි දින,
කොළඹ දී ය.

**නියෝග**

1. මෙම නියෝග “ 2023 අංක 1 ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් (තොරතුරු හෙළිදරව් කිරීම) නියෝග” ලෙස දැක්විය හැක.

2. රාජ්‍ය ණය තිරසරභාවය පිළිබඳ උපදෙස් ලබා ගැනීමේ අරමුණ ඇතිව, මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් රාජ්‍ය ණය ලේඛකාධිකාරී (මෙතැන් සිට ලේඛකාධිකාරී ලෙස හඳුන්වනු ලබන) වෙත නිර්දේශ කළ විටක දී, ශ්‍රී ලංකා රජය විසින් එකී අරමුණ සඳහා පත් කරන ලද පුද්ගලයෙකුට ආඥාපනත යටතේ නිකුත් කරන ලද ඕනෑම ණය උපකරණයක් සම්බන්ධයෙන් එකී නිකුත් කිරීම, හිමිකම් පවත්වාගෙන යාම, ආපසු ගෙවීම සහ එහි මෙහෙයුම් පිළිබඳ රජය විසින් හෝ රජය වෙනුවෙන්, කුමන ආකාරයකින් හෝ පවතින හෝ පවත්වාගෙන යනු ලබන ඕනෑම ලේඛනයක, පොතක හෝ වෙනත් ලියවිල්ලක ඇතුළත් වෙන ලද හෝ ලබාගන්නා ලද තොරතුරු, එම තොරතුරු ලබා ගන්නා පුද්ගලයා විසින් ඉතා රහසිගත ලෙස


1A - G 39686— 07 (2023/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

තබාගන්නා බවට හා එවැනි උපදෙස් ලබාදීමට සම්බන්ධ වූ පුද්ගලයාගේ නියෝජිතයින්ට හැර වෙනත් කිසිදු පුද්ගලයෙකුට එම තොරතුරු හෙළි නොකරන බවට, එම තොරතුරු ලබා ගන්නා පුද්ගලයා විසින් ශ්‍රී ලංකා රජය සමග ගිවිසුමකට එළඹෙන බවට හෝ දැනටමත් ගිවිසුමකට එළැඹී ඇති බවට ලේඛකාධිකාරී විසින් සෑහීමකට පත්වේ නම් ලේඛකාධිකාරී විසින් එවැනි පුද්ගලයෙකුට අවශ්‍ය තොරතුරු හෙළිදරව් කළ යුතු ය.

3. ඉහත 2 වන රෙගුලාසි ප්‍රකාරව, තොරතුරු අනාවරණය කර ගන්නා ඕනෑම පුද්ගලයෙකුට, රාජ්‍ය ණය තිරසාර බව සහතික කිරීම අරමුණු කරගත් දේශීය රාජ්‍ය ණය ක්‍රියාකාරිත්වය තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය ප්‍රමාණයට පමණක් එම තොරතුරු ලබාගෙන පරීක්ෂා කළ හැකිය.

4. ඉහත සඳහන් තොරතුරු හෙළිදරව් කිරීම, ලැබීම සහ පරීක්ෂා කිරීම මගින් ඉටු කිරීමට බලාපොරොත්තු වන රාජ්‍ය අරමුණ සැලකිල්ලට ගත් විට, මේ සම්බන්ධයෙන් කිසිදු පුද්ගලයෙකු විසින් ගාස්තුවක් ගෙවිය යුතු නැත.

EOG 06 - 0084

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.